# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 අගෝස්තු 19 වන සඳුදා**
2013 ஆகஸ்ட்19 திங்கட்கிழமை
Monday 19th August 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.50 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.50 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.50 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2013.08.06 වන දින -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, ඔබතුමා දැන් මේ සභාව පටන් ගත්තත් මම හිතන්නේ, ගණ පූරණය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ගිය සභා වාරයේදීත් ඒ විධියටම ගණ පූරණය නැතිව අවලංගු කළා. ඔබතුමාට හොඳට මතක ඇති මම හිතන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මතකයි. කරුණාකර සීනුව නාද කරන්න.

***පළාත් සභාව ගණන් කොට ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී. පසුව ගණපූරණය ඇති විය.***
*Provincial council counted, and a Quorum not being present, the Division bells were ordered to be rung,*
*Later, a Quorum was achieved.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ වන විට සභාවේ ගණ පූරණය සම්පූර්ණ වී ඇති නිසා නැවතත් න්‍යාය පත්‍රයට යනවා.

# නිවේදනය

## ANNOUNCEMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

***නිල වාර්තා නිවැරදි කිරීම :***

*"2013.08.06 වන දින නිල වාර්තාවේ පිටු අංක 31, තීරු අංක 1066 හි ගරු අජ්මාල් මුවුජුඩ් යන්න වෙනුවට ගරු එම්.එම්.එම්. අම්ජාඩ් යනුවෙන්ද, පිටු අංක 32, තීරු අංක 1067 හි ගරු අජ්මාල් මුවුජුඩ් යන්න වෙනුවට ගරු එම්.එම්.එම්. අම්ජාඩ් යනුවෙන්ද, නිවැරදි විය යුතුය."*

# කාරක සභා වාර්තා

## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2013.08.06 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

මීළඟට ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ රැස්වීම් වාර්තාව පිළිගැන්වීමට එම කාරක සභාවේ සභාපතිතුමා හෝ එම කමිටුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකුට අවස්ථාව.

**ගරු මහේෂ් අල්මේදා [කීර්ති උඩවත්ත කාරක සභා ගරු සභාපති වෙනුවෙන්]**
Hon. Mahesh Almeda [On Behalf of Hon.Chairman of the Committee, Keerthi Udawatte]

ගරු සභාපතිතුමනි, 2013.07.23 වන දින පැවති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම මෙම සභාවට පිළිගන්වනවා.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that the copies of the relevant reports have been placed on the tables of Hon. Members.*

# නොපැමිණ සිටීමේ අවසරය

## LEAVE OF ABSENCE

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, *"නිහාල් ජයවර්ධන ගරු මන්ත්‍රීතුමාට මාස තුනක් නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, 2013 අංක 01 දරන ත්‍රීරෝද රථ නියෝග යටතේ පළ කරන ලද අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අලුතින් නීති ගණනාවක් පනවලා තිබෙනවා. ත්‍රීරෝද රථ රියැදුරන් වෙනුවෙන් නොවෙයි. ත්‍රීරෝද රථවල ගමන් කරන පාරිභෝගික ජනතාවගේ අවශ්‍යතාවයන් වෙනුවෙන්. මගී ජනතාව වෙනුවෙන්. දැන් මේ කාරණයේදී මගීන්ගේ ආරක්ෂාව සම්පූර්ණයෙන්ම තිබෙන්නට ඕනෑ. ඒක පුද්ගලිකව අපි පිළිගන්නවා. අනික් පැත්තෙන් අද මෙය කර්මාන්තයක් විධියට, ස්වයං රැකියාවක් විධියට. ත්‍රීවීල් කර්මාන්තයේ නියැලෙන පිරිස දෙලක්ෂ පනස් දාහකට වැඩිය ඉන්නවාය කියලා ත්‍රීවීල් රථ සංගම් නියෝජිතයන්ගේ මහා සමුළුවේ සභාපතිවරයා මාධ්‍ය තුළින් මේ මෑතකදී ප්‍රකාශයක් කළා. ඒ නිසා මේ නීතියට යටත්ව ලංකාවේ තිබෙන පොලීසි විවිධ නීති ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. දැන් උදාහරණයක් විධියට මා ළඟ තිබෙනවා, කොළඹ තදාසන්න පොලීසියක ලිපියක්. මේකේදී මේ සියල්ල දින 10 ක් ඇතුළත ඉෂ්ට කරන්න ඕනෑය කියලා ත්‍රීරෝද රථ රියැදුරන් ගෙන්වලා ඔවුන්ට උපදෙස් දීලා තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔබතුමා ඒ ටික සභාගත කරනවාද?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔව්. අපි දන්නවා, මේ ත්‍රීරෝද රථ රියැදුරෝ වෙනත් රැකියාවක් කරන්න විධියක් නැතිව, සමහර වෙලාවට කල් බදු ක්‍රමය යටතේ හෝ පිනෑන්ස් ක්‍රමය යටතේ ත්‍රීරෝද රථයක් අරගෙන ඔවුන් තමන්ගේ නගරයේ කොතැනක හරි තියාගෙන ආදායමක් විධියට මේ ත්‍රීරෝද රථ කර්මාන්තයේ නියැලෙන බව. ඒ නියැලෙන කොට දරුවන්ට පොත්පත් ටික අරන් දෙන්න, පවුලේ නඩත්තුව කරන්න, අනික් පැත්තෙන් ඒ ත්‍රීරෝද රථවල මාසික ගාස්තුව ගෙවන්න මේ උපයන මුදල තමයි පාවිච්චි කරන්නේ. ඒ නිසා දින දහයක් පහළොවක් ඇතුළත මීටරය නොගත්තොත් එහෙම මේ -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු විපක්ෂ නායකතුමා, තත්පර කිහිපයක් ඉන්න. අපේ ප්‍රවාහන ඇමතිතුමා සහභාගී වෙනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

එතුමාට අදාළ වෙන්නේ නැහැ නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මධ්‍යම ආණ්ඩුවේ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රකාශය ඉදිරිපත් කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මම මේ කාරණයේදී මතක් කරන්නේ, ඇත්තෙන්ම දැන් මේ ලිපියේ එක පැත්තකින් ත්‍රීරෝද රථ රියැදුරන්ට තර්ජනයක් කරනවා. දැන් මේකේ තිබෙනවා, "*මෙම කටයුත්ත 2013.08.15 වන දින පැය 10 ට අදාළ මෝටර් මනිමණ්ඩපයේදී පැවැත්වේ. මෙම දැනුවත් කිරීමේ වැඩ සටහනට පැමිණීම අනිවාර්යය වේ. නොපැමිණෙන රියැදුරන් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරයි*" කියලා. ඒ කියන්නේ දැන් මේ පොලීසිය කියනවා, අනිවාර්යයෙන්ම මේකට එන්නට ඕනෑ. නොපැමිණියොත් ඒ වෙනුවෙන් අවශ්‍ය කටයුතු සිදු කරමි. මොකක්ද? ඉතාම තදින් මේ නීතිය ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි මේක මතක් කරන්නේ, වෙන මුකුත් නිසා නොවෙයි. එක පැත්තකින් ත්‍රීරෝද රථයේ ගමන් කරන මගියා ආරක්ෂා කරන ගමන්ම ත්‍රීරෝද රථය එළවන, ස්වයං රැකියාවක් විධියට මේ කාරණය ඉෂ්ට කරන ත්‍රීරෝද රථ රියැදුරන් පිළිබඳවත් මීට වඩා සැලකිල්ලෙන්, කල්පනාවෙන් කටයුතු කරන්නට ඕනෑය කියලා. ඒ නිසා මේ මීටරයක් සවි කිරීමේ තීන්දුව අඩු ගණනේ ඒ අයට සහනයක් වන විධියට අද වන තුරුත් - මේ සම්බන්ධයෙන් මේ යෝජනාව පිළිබඳව පළාත් සභාව අපව දැනුවත් කරලා නැහැ. ඒ නිසා මේ පොලීසි, ත්‍රීරෝද රථ රියැදුරන් රැස් කරලා, මෙවැනි තර්ජනාත්මක ගුලි ඒ ත්‍රී රෝද රථ රියැදුරන්ට අද පනවලා තිබෙනවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, ගරු ඇමතිතුමාත් ඉන්න වෙලාවක මේ මීටර් සවි කිරීම අඩුම ගණනේ හය මාසයකටවත්, ලබන ජනවාරි පළමුවැනිදා ඉඳලා ඔවුන්ට ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පහසුකම ලබා දෙන්නය කියලා ඔබතුමා මගින්, ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, වැදගත් ප්‍රශ්නයක් මෙතුමා මතු කළේ. පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න අවශ්‍යයි. ඔය නීතියක් පොලීසිය පැනෙව්වා කියලා ඔබතුමාගේ කථාවේදී කිව්වා. එහෙම නැතිව වෙන අමාත්‍යාංශයකින් පනවපු නීතියක් සම්බන්ධවද ඔබතුමා පැහැදිලි කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මට දිගින් දිගටම මේ ගැන අවස්ථාව දෙන්න අමාරුයි.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

පොඩි පැහැදිලි කර ගැනීමක්. ගරු සභාපතිතුමනි, මෙතුමාගේ කථාවේදී කියැවුණා, පොලීසිය විසින් නීතියක් පැනෙව්වාය කියලා. පොලීසියකට නීති පනවන්න බැහැ. පොලීසියට තිබෙන්නේ පවතින නීතිය ක්‍රියාත්මක කරන්නයි. ඉතින් ඒ නිසා මට පැහැදිලි කර ගැනීමට අවශ්‍යයි. ඔබතුමා කිව්වා එකේ පොලීසිය -

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

රථවාහන අංශය මේ නියෝගය දීලා තිබෙන්නේ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

රථ වාහන අංශය නියෝගයක් දුන්නේ, මොන කරුණු යටතේද?

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේකේ කියලා තිබෙන්නේ, 2013 අංක 01 දරණ ත්‍රීරෝද රථ නියෝග. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අංක 1821/31 රජයේ නිවේදනය 2013.07.31. ඒ අනුව පොලීසිය තමයි මේ නියෝගය කරන්නේ. පොලීසිය කියනවා, මෙම දැනුවත් කිරීමේ වැඩ සටහනට පැමිණීම අනිවාර්යය වේ. නොපැමිණෙන රියැදුරන් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරමි. ඒ කියන්නේ මේකට යම් හේතුවකින්, අසනීපයකින්, වෙනත් අමාරුවකින් අර ත්‍රීරෝද රථ රියදුරාට එන්න බැරි වුණොත් මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරනවාය කියන එක තමයි අපට ප්‍රශ්නය. එක්කෝ කූඩුවේ දානවාද? වෙන නඩු දානවාද? නැත්නම් ඒ යකාගේ අත පය කඩනවාද? පොලීසිය මේ තර්ජනාත්මක ගුලි තමයි අහිංසක ත්‍රීරෝද රථ රියැදුරන්ට එවන්නේ.

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

***[නැඟී සිටියේය.]***
*[Stood.]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කථාව අවසන් කරන්න. ගරු ඇමතිතුමා, පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ විවාදයකට යන්න දෙන්න පුළුවන්කමක් නැහැ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව මටත් දැනුවත් වෙන්න පුළුවන්කම ලැබුණා. මෝටර් රථ කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් තමයි මේ ගැසට් නිවේදනය ප්‍රවාහන අමාත්‍යාංශය හරහා ගැසට් කරලා තිබෙන්නේ. එතකොට මේ සම්බන්ධව මම පොලීසියට කථා කරලා ඇහුවාම, දැනගන්න ලැබුණා, පොලීසියෙන් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් ගෙනියන බව. ඒ දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළ තමයි ඔය ලිපියේ තිබෙන්නේ. එතකොට ඔය තුළින් මිනිස්සුන්ට ගහන්න, කූඩුවේ දාන්න, හිරේ දාන්න නොවෙයි. 2013 දෙසැම්බර් මාසේ 31 වැනිදා ඉඳලා තමයි මේක 2014 ක්‍රියාත්මක කරන්න තිබෙන්නේ. එතකොට මේ අනුව තමයි දැනට දැනුවත් කර ගෙන යන්නේ, මේ අයට ත්‍රීරෝද රථයට මීටරයක් සවි කර ගන්න කියලා. ඉතින් මේක තමයි අපේ විපක්ෂ නායකතුමා මේ සභාවට ඉදිරිපත් කරන්න යෙදුණු කරුණ. නමුත් ඒ ලිපියේ තිබෙන වචන, අකුරු මම දන්නේ නැහැ කොයි ආකාරයෙන් හසුරුවලා තිබෙනවාද කියලා. ඒ නිසා මම ඉදිරි සතිය ඇතුළත අපේ පොලිස් දෙපාර්තමේන්තුවත් එක්ක කථා කරලා මේ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග ඔක්කොම ගන්න කටයුතු කරනවා වාගේම ගරු සභාපතිතුමනි, ත්‍රී රෝද රථ ප්‍රඥප්තිය මේ සභාවේ අනුමත කරලා දැන් අපි භාෂා පරිවර්තනයට යවලා තිබෙනවා. අපි දැන් මේක ගැසට් කළත් මේ කටයුත්ත කරන්න, මම ලක්ෂ පහක මුදලකුත් වෙන් කරලා, වෙනම කාර්යාලයක් අපි අරින්න කටයුතු කරලා තිබෙනවාය කියන එක මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට දැන ගන්න මම ප්‍රකාශයක් හැටියට කරන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, මේ පෞද්ගලික මඟී ප්‍රවාහන සේවාව 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අයිති වෙලා තිබෙන්නේ පළාත් සභාවට. එතකොට අපේ ඇමතිතුමා කියනවා, මෝටර් රථ කොමසාරිස්තුමා තමයිලු මේ නියෝගය දාලා තිබෙන්නේ. එහෙම නම් මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි. පළාත් සභාවට තිබෙන විෂයයක් පිළිබඳව පළාත් සභාව දැනුවත් නොකර, මෝටර් රථ කොමසාරිස්වරයාට ක්‍රියාත්මක කරන්න බලය තිබෙනවාද කියන එක. ගරු සභාපතිතුමනි, අපේ එකඟතාවය අහලා තමයි මේක ගෙනෙන්න ඕනෑ. අද මේ පොලීසියෙන් එවලා තිබෙන මේ ප්‍රශ්නය අපට තේරෙන විදියට ජනතාව කියන්නේ - පොලීසිය උදේට සේවය කරලා පොලීසියේ රාළහාමිලා හවස ත්‍රීවීල් රියැදුරු වෘත්තියේ යෙදෙනවාලු. ඔවුන් 55% ක් ඉන්නවාලු. ඒක ගණිකා වෘත්තියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා,

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක තමයි මේ එවලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගේ මාර්ගයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඔබතුමාගේ රීති ප්‍රශ්නය පැහැදිලියි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑ. අර රීති ප්‍රශ්නය අපෙන් අහලා මිසක් දාන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ගැන අපි පස්සේ -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ ගැන ගරු අමැතිතුමාගේ ප්‍රකාශයත් එක්ක කාරණයක් මතක් කරන්නට ඕනෑ. එතුමා කියන කාරණය ඇත්ත වෙන්න ඇති. නමුත් මේ නීතිය ක්‍රියාත්මක කිරීමේදී විවිධ පොලීසි කියන්නේ, ඒ තම තමන්ට ආවේණික වූ ක්‍රමවේදයක් යටතේ තමයි මේක ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ කියලා. ඒ නිසා පැහැදිලිව, මම හිතන්නේ මේ පිළිබඳව ප්‍රකාශයක් වෙන්නට ඕනෑ. ජනවාරි පළමුවැනිදා ඉඳලා තමයි මේ තීරණ - මෙහි තීරණ ගණනාවක් තිබෙනවා. මේකේ තීන්දු 09 ක් තිබෙනවා. ත්‍රීරෝද රථය ප්‍රවාහනය -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ප්‍රමාණය.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ප්‍රමාණය සියල්ලම තිබෙනවා. දැන් සමහර වේලාවට තුන්දෙනෙක් මෙහි ගෙනි යනවා කියලා කියනවා. හතර දෙනෙක් ගෙනි යන්නේ වෙන මොකුත් නිසා නොවෙයි. අර යන මගියාට ඇත්තෙන්ම වෙන කාර් එකක යන්න බැහැ. වෑන් එකක යන්න බැහැ. ත්‍රීරෝද රථයේ හතරදෙනෙක් යනවා. ඒ මිනිස්සුත් කැමැති නැහැ හිරවෙලා යන්න. ඒ නිසා මම කියන්නේ මේ දෙපැත්තම පිළිබඳව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා දිගින් දිගටම මෙලෙස ප්‍රකාශ කිරීම අපට ගැටලුවක් වෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේක කර්මාන්තයක් විධියට අද තිබෙන්නේ. ඒ කර්මාන්තය ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළකට යන්නට ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන්නේ අපේ ගරු ප්‍රවාහන ඇමැතිතුමාට අවස්ථාව තිබෙනවා. ඔබතුමා අමාත්‍යාංශ මට්ටමින් මේ සම්බන්ධව -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒ කැඳවා තිබෙන ප්‍රකාශයේ පිටපතක් මට ලබා දෙන්න. ඉදිරියේදී මට ඒ පිළිබඳව කටයුතු කරන්න පුළුවන්. ඒ වාගේම මේ අවස්ථාවේ සතුටු වෙනවා, උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා මේ ත්‍රීවිල් රථවලට මීටර් දෙන්න කටයුතු කිරීම සම්බන්ධව. අද එකේ වටිනාකම විපක්ෂයේ අයට දැන් තේරෙනවා. විපක්ෂයේ අය එතුමාට විරුද්ධව උසාවියට ගියා. නමුත් අද ඒකේ වටිනාකම ඔක්කෝම අයට තේරෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම්.එස්.එම්. ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීම සඳහා අවස්ථාව.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි. රටේ දිගටම මුස්ලිම් දේවස්ථානවලට ප්‍රහාර එල්ල වෙනවා. ගරු සභාපතිතුමනි, මේ මාසයේ 10 වැනිදා ග්‍රෑන්ඩ්පාස්, කොස්ගස් හංදිය, මෝලවත්තේ වුණු සිද්ධිය සම්බන්ධව, ඇත්ත වශයෙන්ම මුස්ලිම් ජනතාව වශයෙන් අපි ඉතා හිත් වේදනාවෙන් සිටියා. මේක පූජනීය ස්ථානයක්. පල්ලියක්. එතැන පොලීසියේ රාළහාමිලා, පොලීසියේ උසස් නිලධාරීන් 40 කට වැඩි පිරිසක් ඉන්න කොට 20 ක්, 25 ක් වාගේ සුළු පිරිසක් ඇවිල්ලා පල්ලියට ගල්වලින් ගැහුවා. CCTV කැමරා එකෙන් ඒක පටිගත වෙලා තිබෙනවා. ඒක අපි පොලීසියට භාර දුන්නා. අතිගරු ජනාධිපතිතුමාට භාර දුන්නා. හැම කෙනෙකුටම භාර දුන්නා. අද වනතුරු එක්කෙනෙක්වත් අත්අඩංගුවට අරගෙන නැහැ. මේක බස්නාහිර පළාත් සභාවේ වුණු භයානකම සිද්ධියක්. අපි අද මේ සභාවේදී ප්‍රකාශ කරන්නේ, මෙය මෙතැනින් නතර වෙන්න ඕනෑ. මින් ඉදිරියට මෙය ගියොත් ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙනවා.

එදා 11 වැනිදා බුද්ධශාසන අමාත්‍යාංශයේදී දෙපාර්ශවයම එකතු වෙලා පිළිවෙළකට කටයුතු කළා. අපට සන්තෝෂයි. මොනවා වුණත් හරි එදා වුණාට පස්සේ අද වනතුරු එතැන ආගම කියන්න පල්ලි දෙකම අපට නැතිව ගියා. මේගොල්ලෝ කිව්වේ, පල්ලියක් දෙනවා. පර්චස් 06 ක ඉඩමක් දෙනවා. එතැන තිබෙන බෝ ගහ කපලා දෙන්නම් කියලා කිව්වා. බෝ ගහ කපලා තිබෙනවා. පල්ලියේ තිබෙන්නේ පර්චස් 01 යි. අද වනතුරු ඒ පල්ලිය හදනතුරුවත් අපේ ජනතාවට, අපේ මුස්ලිම් ප්‍රජාවට ආගම කියන්න, වඳින්න තැනක් අපට නැතිව ගියා. හිත් වේදනාවෙන් අපි කථා කරන්නේ.

බස්නාහිර පළාත් සභාවේ මේ සභාවේ මම කථා කරන්න ගත්තේ ගරු මහ ඇමැතිතුමන් ඉන්නවා නම් මට හරි සන්තෝෂයි. බස්නාහිර පළාතේ මුස්ලිම්, සිංහල, බර්ගර් හැම එක්කෙනාම මේක භාරගන්න ඕනෑ. කොයි පල්ලියක් වුණත් හරි, මුස්ලිම් පල්ලියක් හරි, දේවස්ථානයක් හරි, පන්සලක් හරි, කෝවිලක් හරි මොනවා වුණත් හරි බස්නාහිර පළාත් සභාවේ මෙහෙම දෙයක් වෙනවා නම්, මේක වහාම නතර කරන්න ඕනෑ. පොලීසියෙන් බලාගෙන සිටියේ. මේ සිද්ධිය 10 වැනිදා වෙනවා කියලා පොලීසියට අපි දන්වලා තිබෙනවා. ග්‍රෑන්ඩ්පාස් පොලීසියට අපි ලිඛිතව දන්වලා තිබෙනවා. 10 වැනිදා රෑ 12.00 ට ඉස්සර අපේ පල්ලියට ගහන්න යනවා කියලා. පොලීසියෙන් එතැන 40 ක් විතර මුර කළා. එක රාළහාමි කෙනෙක්ට හරි, පොලීසියේ එක ASP කෙනෙක්ටවත්, OIC ටවත් - අදට දවස් 07 ක් ගත වෙලාත් ඉවරයි. එක්කෙනෙක්වත් පොලීසියට අත්අඩංගුවට ගන්න බැරිව ගියා. CCTV කැමරා CD එකත් පොලීසියට අපි භාර දීලා තිබෙනවා. මේ ගැන වහාම ක්‍රියාත්මක වෙන්න. රජයත් නිහඬයි. රජයත් මේ ගැන මොනවත් කථා කරන්නේ නැහැ.

අපත් මේ රටේ ඉන්න, අයිතිවාසිකම් තිබෙන ජනතාව. ඇයි අපට මෙහෙම කරන්නේ? ඇයි? අපව අයින් කරන්න කල්පනා කරන්නේ. මේ මුස්ලිම් ජනතාවගේ අයිතිය. පල්ලියක්, පන්සලක්, කෝවිලක් කියන්නේ, අපි එතැන ගිහිල්ලා වෙන මොනවත් කරන්න යන්නේ නැහැ. ඒ අසල කුඩු බිස්නස් කරනවා. මත්ද්‍රව්‍ය විකුණනවා. බාර් හදලා තිබෙනවා. ඕවා නතර කරන්න කවුරුත් කථා කරන්නේ නැහැ. පල්ලියක් හදපු ගමන් ඔක්කොම එනවා. අපි පල්ලියක් හදන්න ගියේ නැහැ. තිබෙන පර්චස් 01 පල්ලිය එතැනින් අයින් කරනවා. එතැන බෝ ගහක් තිබෙනවා. එක කාලයක ඒ බෝ ගහේ අත්තක්වත් කපන්න ඒ අය දුන්නේ නැහැ. අද සම්පූර්ණයෙන්ම බෝ ගහ ඉවත් කරනවා. ඒක පන්සල ළඟ තිබෙන පොඩි පල්ලියක්. පර්චස් 01 ක්. ඒ පර්චස් 01 පල්ලිය හදනකොට එතැන ගෙවල් 40 යි තිබුණේ. අද එතැන පවුල් 380 ක් ඉන්නවා. TNL එකේ විවාදයට යනවා. ස්වාමීන් වහන්සේ මේක පිළිගත්තා. සිංහල ගෙවල් 120 යි තිබෙන්නේ. මුස්ලිම් ගෙවල් 380 ක් තිබෙනවා කියලා. ඉතින් පර්චස් 01 ක තිබෙන පල්ලියක පවුල් 380 ක් කොහොමද ප්‍රාර්ථනා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ පැහැදිලි කිරීම පුළුවන් තරම් කෙටි කරන්න. කාලය අවසන්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේ ගැන අපේ බෞද්ධ ජනතාව, අපේ මන්ත්‍රී කණ්ඩායම එකතු වෙලා බස්නාහිර පළාත් සභාවේ මේ වාගේ දෙයක් වෙන්නේ නැති විධියට වගබලා ගනිමුයි කියලා කියමින් මගේ වචන ස්වල්පය මෙතැනින් අවසන් කරනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. දැන් සති කීපයක් ගත වෙලා තිබුණත්, අපේ හිත්වලින් මේ කනගාටුදායක සිද්ධිය තවම ඉවත් වෙලා නැහැ. මේ සිද්ධිය නිසා ජීවිතක්ෂයට පත් වුණ අයටත්, පීඩාවට පත් වුණු ජනතාවටත් අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. මේ සිද්ධියට මූලික වුණේ ඇත්ත වශයෙන්ම නියම වේලාවට තීරණයක් ගන්න බැරි වීම හේතුවෙන් බව මම හිතන්නේ මටත් වැඩිය හොඳට ඔබතුමා දන්නවා. මොකද මෙය ප්‍රාථමික මට්ටමින් විසඳගන්න තිබුණු අවස්ථාවක්. මෙය දුර දිග යන්න ඇරලා අද මෙය විශාල ව්‍යසනයක් විධියට අපේ රටේ නොමැකෙන කළු පැල්ලමක් හැටියට ජාත්‍යන්තරව කථාවෙන තත්ත්වයට මේ සිද්ධිය පත් කෙරුවා.

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ඔබතුමා හොඳටම දන්නවා. මේ සිද්ධියේදී මූලික වුණේ ජලය. අපි දන්නවා, අපේ රටේ අවුරුදු 30 ක් තිබුණු ඒ අවාසනාවන්ත යුද්ධය අවසාන කරන්නට එදා අතිගරු ජනාධිපතිතුමා තීරණය කෙරුවේ - මාවිල්ආරු සොරොව්ව වහලා ඒ ජනතාවට බොන්න තිබුණු වතුර ටික නතර කරපුවාම ඒ බිහිසුණු කොටි ත්‍රස්තවාදය අවසන් කරන්න එතුමා තීරණය කෙරුවා. එතුමා ඒ මාවිල්ආරු සොරොව්ව නැවත වතාවක් අපේ වීරෝධාර රණවිරුවන් මාර්ගයෙන් විවර කරලා, මේ රටේ අවුරුදු 30 ක් තිබුණු ම්ලේච්ඡ යුද්ධය සඳහටම අයින් කරන්න ඕනෑ කරන විධියට යුධමය ක්‍රියා මාර්ගයක් අරගෙන එදා නන්දිකඩාල් කළපුවෙන් ඒ යුද්ධය අවසන් කෙරුවා. ඒක අපි දන්නවා. එදා ඒ ජනතාව ඒ තත්ත්වයෙන්ම නොවුණත්, වැලිවේරිය ජනතාව, රතුපස්වල අවට ජනතාව ඉල්ලුවේත් වතුර. මේක බොහොම සාධාරණ විධියට ඉවර කරන්න තිබුණු ප්‍රශ්නයක්. නමුත් මේකට කල් මරමින්, බලධාරීන් මගහරිමින් තිබුණු නිසා තමයි මේ අවාසනාවන්ත තත්ත්වය ඇති වුණේ. ඒක දේශපාලන වගකීමක්. මම හිතන්නේ, එතැන්ට නියම ආකාරයට ලැබුණේ නැහැ. නමුත් එදා ඒ සිද්ධියේදී සාමකාමීව ඒ විරෝධතාවය දක්වපු ජනතාවට මේ රටේ තිබෙන සම්මත නීතිය අනුව නොවෙයි කටයුතු කෙරුවේ. එදා ඒක සාකච්ඡාවෙන් ඉවර කරන්න තිබුණා. අඩු ගණනේ මූලික

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ]

වශයෙන් ඒ විරෝධතාවය විසුරුවා හරින්න උවමනා කරන කටයුතු කෙරුවේ නැහැ. අඩුම තරමින් ජල ප්‍රහාරයක් එල්ල කරලා, එහෙම නැත්නම් කඳුළු ගෑස් ටිකක් ගහලා ඒක විසුරුවා හරින්න තිබුණු අවස්ථාව නොවෙයි, පොලීසිය ක්‍රියා කෙරුවේ. ඊළඟට හමුදාව මැදිහත් වෙලා දිගට හරහට වෙඩි තියන්න පටන් ගත්තා. එසේ වෙඩි තියන්න පටන් ගන්නකොට වැලිවේරියේ ශුද්ධ අන්තෝනි මුනින්ද්‍රයාගේ දෙව් මැදුරට ආරක්ෂාව පතාගෙන, පිහිට ඉල්ලගෙන බේරෙන්න තමයි ඒ ජනතාව ගියේ. මම හිතන්නේ මෙතැන ඉන්න කතෝලික මන්ත්‍රීවරු දන්නවා. ශුද්ධ වූ අන්තෝනි මුනින්ද්‍රයා කියන්නේ, කතෝලික ආගමේ විධියට මොනතරම් බලගතු මුනින්ද්‍රවරයෙක්ද කියලා. එතුමාගේ ඒ දේවස්ථානයට ගිහිල්ලා රැකවරණය ඉල්නකොට - ඒ කන්‍යාරාමයේ හිටපු ගරු කන්‍යා සොහොයුරිය, කඩා වැදුණු හමුදාවේ අවිආයුධත් එක්ක ආපු අයට ඇතුළු වෙන්න ඉඩ නොදුන්නාම ඒ කන්‍යා සොහොයුරියගේ පපුවට තුවක්කුව තියලා - ඒ කන්‍යා සොහොයුරිය මාත් එක්ක කිව්වා. පපුවට තුවක්කුව තියලා ඉතාම නින්දිත, කැත කුණු හරුපවලින් තමයි ඒ කන්‍යා සොහොයුරියට කථා කරලා තිබෙන්නේ. මම හිතන්නේ, මේක කතෝලිකයෙක් හැටියට, තදබල වේදනාවක් හැටියට හැමදාම මගේ හිත පාරනවා. ඒ වෙලාවේදී එතැනදී -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ආගමික ප්‍රශ්නයක් ද ඇති කරන්න හදන්නේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නැහැ. ආගමික ප්‍රශ්නයක් ඇති කරන්නේ නැහැ. දැන් මීට ඉස්සෙල්ලාත් අපේ ගරු මන්ත්‍රීතුමා මේ සභාවේ කිව්වේ ආගමික ප්‍රශ්න. මේවා ඇති වෙන්න දෙන්න ඕනෑ නැහැ. අපි ජාතිවාදයෙන් අවුරුදු 30 ක් බැට කාපු ජනතාවක්. නැවත මේ රටේ ආගමික ප්‍රශ්න ඕනෑ නැහැ. ඒක නිසා එදා ඒ තත්ත්වයේදී - නමුත් ඒක ඇහුවේ නැහැ. ඔබතුමා එතැන සිටියා. හුහක් මේ ප්‍රශ්නවලට සහභාගි වුණු නිසා ඔබතුමා මට වැඩිය හොඳට මේ සිද්ධිය දන්නවා. පල්ලිය වත්තේ දණ ගස්සවලා මිනිසුන්ට අමානුෂික විධියට සැලකුවේ. ගැබ්බර මාතාවන්ට පවා ගැහුවේ. එහෙම ගහලා තරුණයෙක් මැරුණා. ඒ ලේ හේදුවේ පාන්දර තුනට ඇවිල්ලා. හැබැයි, මතක තියා ගන්න රතුපස්වල කියලා නම හැදුණේ පස්වල රතු පස් තිබුණු නිසා. නමුත් දැන් තමයි රතුපස්වලට නියම අර්ථයක් ලැබුණේ. මොකද, මේ ජනතාවගේ ලේවලින් -

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

88, 89 කාලයේ -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

තමුන්නාන්සේ කතෝලිකයෙක් හැටියට මේකට විරුද්ධත්වය ප්‍රකාශ කරන්න ඕනෑ. මොකද, පල්ලියේ තමයි ලේ තිබුණේ. ඒක නිසා මම කියනවා. කරුණාකරලා මේ සිද්ධිය පිළිබඳව අපක්ෂපාති පරීක්ෂණයක් කරන්න. මොකද, මීට පෙර කටුනායක රොෂේන් චානක මැරුණා. අද වනතුරු වාර්තාව නැහැ. ධීවරයෙක්ට වෙඩි තියලා මැරුවා. අද වනතුරු වාර්තාව නැහැ. දැන් වැලිවේරියටත් ඒක තමයි වෙන්නේ. මගේ කථාව අවසන් කරන්න ඉස්සෙල්ලා ඔබතුමාගේ මාර්ගයෙන් ශුද්ධ වූ සුවිශේෂයේ ලියලා තිබෙන වාක්‍යයක් කියන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පුළුවන් තරම් කෙටි කරන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශ කරනවා, කොයි පියාද තමන්ගේ දරුවෙක් බිත්තරයක් ඉල්ලුවාම -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ආගම ගැන දන්නෙත් නැහැ කියන්න. බයිබලය ගැන දන්නෙත් නැහැ. මෙතැන බොරු කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ගරු මන්ත්‍රීතුමා ඔබතුමා වාඩි වෙන්න. බාධා කිරීම් කරන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

පන්සලේ සිටිය රණවිරුවන්ට මොකද වුණේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒක නිසාවෙන් මේ වෙලාවේ තමුන්නාන්සේ මාර්ගයෙන් කියන්න ඕනෑ -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මෙතැන ආගම් වාදයක් ඇති කරන්න හදනවා. ආගම් රැල්ලක් හදන්න හදනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ආණ්ඩුවේ හිතවතුන්ව හුරතල් කරන්න ගිහිල්ලා තමයි මේ අවාසනාවන්ත සිද්ධිය සිදු වුණේ. හැබැයි, දැන් මේ සිද්ධිය වුණාට පස්සේ කොහොමද? ඉතාමත්ම වේගයෙන් ජල නළ එළලා වතුර දෙන්න කටයුතු කෙරුවේ. බවුසර්වලින් වතුර අදින්නේ. ඒක නිසා නියපොත්තෙන් කඩන්න තිබුණු දේ අවාසනාවන්ත විධියට ජීවිත තුනක් නැති කරලා, මිනිසුන්ට හානි කරලා, පීඩාවට පත් කරලා, පල්ලියට ගහලා, පල්ලියේ බිම ලේවලින් හෝදලා තමයි අද මේ ප්‍රශ්නය විසඳන්න උත්සාහ කළේ. ඒක නිසා කතෝලිකයෙක් හැටියට මගේ අප්‍රසාදය මේ සභාවේදී පළ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. මම මුලින්ම කියනවා, අපේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා අද අපට සාමකාමී රටක් බිහි කරලා තිබෙනවා. යුද්ධයෙන් තොර සියලු දෙනාටම උතුරේ ඉඳලා දකුණ දක්වා සාමයෙන් සමඟියෙන් ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කරලා තිබෙනවා. ඒ නිර්මාණය වීම තුළ ත්‍රස්තවාදය කියන වචනය ශබ්දකෝෂයෙන් අයින් කරන්න පුළුවන් තත්ත්වයට අද අපි පත් වෙලා තිබෙනවා. නමුත් ඒ ත්‍රස්තවාදය කියන වචනය ශබ්දකෝෂයෙන් අයින් කළත් අද ඒ ත්‍රස්තවාදය කියන වචනයට අනුප්‍රාප්තිකයක් යොදමින් අන්තවාදයක් මතුවෙලා තිබෙන එක පිළිබඳව අපි මේ සභාවේ ඉතාමත්ම දැඩි ලෙස, තීව්‍ර ලෙස සලකා බලන්න ඕනෑ කාලය මතු වෙලා තිබෙනවයි කියන එක අපි දකිනවා.

ඇයි මේ ත්‍රස්තවාදය අද අන්තවාදයක් බවට පරිවර්තනය වෙලා තිබෙන්නේ? අද ජාත්‍යන්තර බලවේග බලාගෙන ඉන්නවා, මේ රට තුළ ස්ථාපනය වුණු සාමය විනාශ කරන්නට. ජාතීන් අතර ව්‍යාකූලත්වයක් නිර්මාණය කරන්න. ජාතීන් අතර තිබෙන්නා වූ සමඟිය නැති කරලා නැවත වතාවක් අද ලංකාව යුද්ධයක් බවට නිර්මාණය කරන්න අවශ්‍ය කරන පරිසරය සකස් කිරීමට තමයි අද ජාත්‍යන්තර සංවිධාන මාන බලාගෙන ඉන්නේ. අද අපි දකිනවා, ආසියාවේ ඉන්දියාව වාගේ රටවල් ගත්තොත්, බංගලාදේශය වාගේ රටවල් ගත්තොත්, පකිස්තානය වාගේ රටවල් ගත්තොත් ඒ රටවල්වල ජාතිවාදය, වර්ගවාදය විශාල ලෙස වපුරන රටවල් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒවාට සාපේක්ෂව බලනකොට ලංකාව ගත්තොතින් මම හිතන්නේ ජාතිවාදය, වර්ගවාදය නැති රටක් බවට පත් වෙලා තිබුණු රට අද ක්‍රමානුකූලව යම් යම් බලවේග ඉස්මතු වෙලා, ඒ බලවේගයන්ගේ අවශ්‍යතාවයන්, දේශපාලන අවශ්‍යතාවයන් මුදුන්පත් කරවා ගැනීමේ අභිලාෂයෙන් අද තමන්ගේ ජාතිවාදී අදහස් ප්‍රකාශයට පත් කරමින් යනවා. මම දැක්කා, අද අප රට තුළ නිර්මාණය වන මේ ක්‍රියාදාමය තුළ, අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, අපේ බෞද්ධ ජනතාවගෙන් 95% ක් මේ ජාතිවාදයට විරුද්ධ, වර්ගවාදයට විරුද්ධ ජනතාව කියන එක. මම හිතන්නේ ආසියාවේ අනෙකුත් රටවලට සාපේක්ෂව බෞද්ධ ජනතාවෙන් 95% ක් විශේෂයෙන් බෞද්ධ ජනතාව කියන්නේ, තමන්ගේ ලිබරල් ආගම්වාදය තුළ තමන්ගේ දර්ශනය හොඳින් පවත්වා ගෙන යන, ආගම පිළිබඳව හොඳ අවබෝධයක් තියෙන, ඒ වාගේම ජනයා පිළිබඳව හොඳ අවබෝධයක් තියෙන සමඟියෙන් ජීවත් වෙන පිරිසක් කියලයි. ඒ වාගේ තත්තවයක් තුළ යම් යම් කණ්ඩායම් මඟින් අද රට තුළ නිර්මාණය කරන ප්‍රකාශ පිළිබඳව සලකා බැලීමේදී අද අප රට තුළ ජාතීන් අතර තිබෙන බැඳියාව, ජාතීන් අතර තිබෙන සමඟිය පිළිබඳව යම් යම් ගැටළුකාරී තත්ත්වයන් උදා වෙලා තිබෙනවා. අපි පසුගිය වකවානුවේ දැක්කා, මහියංගණයේ මුස්ලිම් පල්ලියට ප්‍රහාරයක් එල්ල වුණා. ඒ වාගේම දඹුල්ල පල්ලියට ප්‍රහාරයක් එල්ල වුණා. ඒ වාගේම දෙහිවල පල්ලියට ප්‍රහාරක් එල්ල වුණා. ඊට පස්සේ අපි දැක්කා පසුගිය කාල වකවානුවේදී ග්‍රෑන්ඩ්පාස් පල්ලියට ප්‍රහාරයක් එල්ල වුණා. මෙලෙස දිගින් දිගටම මේ තත්ත්වය පත්වුණොත් මම හිතන්නේ සතියෙන් සතිය මාසෙන් මාසේ මේ වාගේ තත්ත්වයන්ට පත් වෙනකොට මම හිතන්නේ, මින් විපක්ෂය නොවේ, අසීරුතාවයට පත්වෙන්නේ ආණ්ඩු පක්ෂය තමයි අසීරුතාවයට පත් වෙන්නේ කියන එක -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමාලා බාධා කිරීම් කරන්න එපා. කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

මේ සිදුවීම් දිහා බලාගෙන විපක්ෂය අද බොරුවට කඳුළු හලනවා. මේ කඳුළු හලන්නේ දේශපාලන වාසි ලබා ගැනීමට.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පැහැදිලිවම.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ඒ නිසා මම මේ අවස්ථාවේදී කියන්නේ, රටේ එක නීතියයි ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපනය කරපු නීතිය විතරයි. රටේ කැළෑ නීතිය ක්‍රියාත්මක කරන්න දෙන්න බැහැ. මම වගකීමක් ඇතුව කියනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් සියලු දෙනාටම ජාතීන් අතර සමඟිය, බැඳීම ඇති කරන්නට, ඒ විශ්වසනීයත්වය තහවුරු

[ ගරු එම්.එම්.එම්. අම්ජාඩ් ]

කරන්නට, ඒ කර්තව්‍යය ක්‍රියාත්මක කළ යුතුයි. ඒ නිසා මම හිතන්නේ, අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ සාමය ස්ථාපනය කරලා, රට සංවර්ධනය කරා ගෙන යන මොහොතක යම් යම් බාධා ඇති වෙනවා නම්, ඒ බාධා සියලු දේ නිරවුල් කරගෙන අපි සියලුදෙනාම සාමයෙන් සහජීවනයෙන් ජීවත් වීමේ අවශ්‍යතාවය තේරුම් අරගෙන ඒ ජාත්‍යන්තර බලවේගවලට අසු නොවී, ඒ සියලු දේ පරාදය කරන්න ඕනෑ කියන එක තමයි අපි මේ අවස්ථාවේ දී කියන්නේ. අද අපි දන්නවා, මේ පිටුපස සිටින සියලු දේවල්. අද අන්තවාදය රට තුළ ක්‍රියාත්මක වීම පිළිබඳව මම දකින්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රකාශය කෙටි කරන්න.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

මේ අන්තවාදයට ජනමාධ්‍ය ප්‍රචාරක අංශයෙන් යම් සහයක් ලබා දෙන්නා වූ ප්‍රචාරණයන් නවත්තන්න ඕනෑ. මේ ජනමාධ්‍ය මගින් මේ අන්තවාදීන්ට ලබා දෙන්නා වූ ප්‍රචාරක මාධ්‍ය යම් තරමකට සීමා කරන්න පුළුවන් වෙනවා නම්, මම හිතන්නේ ඒ තුළ රටේ නීතිය හා සාමය ස්ථාපනය කරන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. ඒ නිසා අද නිදැල්ලේ මේ අන්තවාදය ක්‍රියාත්මක කරමින් රට තුළ ගෙන යන්නා වූ මේ ජාතිවාදී, බෙදුම්වාදී මේ මාධ්‍ය යාන්ත්‍රණය වහාම අත් හිටුවන්න කටයුතු කරන්න රජය මැදිහත් වෙන්න ඕනෑ කියලා වගකීමක් ඇතිව කථා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. ස්තුතියි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, -

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, මමත් විශේෂ ප්‍රකාශයක් කරන්න අවස්ථාව ඉල්ලා සිටියා. මම වරප්‍රසාද කඩවීමක් වශයෙන් කථා කරන්නේ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

කොළේ දුන්නා නේ?

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

නැහැ. කථාවල් දීලා ඉවරයි දෙන්න බැහැයි කිව්වා. ඒ ගැන මම කනගාටු වෙනවා. නමුත් මම ප්‍රාර්ථනා කරනවා, මේ රට තුළ සාමය ගෙන යන්න සාදාකාලීක අවස්ථාවක් ලැබෙන්න කියලා. පටු විධියට වැඩ කරන කිසිම කෙනෙකුට මේ රටේ සාමය බිඳින්න අවස්ථාව ලැබෙන්න එපා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ මම ඔබතුමියට වේලාව දෙන්නම්. ඔබතුමිය කලබල වෙන්න එපා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, පසුගිය වර්ෂයේ අගභාගයේදී මේ රටේ අතිමහත් බහුතර සමෘද්ධි නිලධාරීන්ගෙත්, සමෘද්ධි ව්‍යාපාරයට සම්බන්ධ ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේත් ප්‍රාර්ථනාවක් විධියට, ඒ වාගේම රජයේ ප්‍රධාන වැඩ පිළිවෙලක් විධියට දිවිනැගුම දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම හරහා, මේ රටේ සමෘද්ධි නිලධාරීන්ට විශ්‍රාම වැටුප් හිමිකම තහවුරු කරන්නත් ඒ වාගේම සමෘද්ධි ව්‍යාපාරයේ ඒ දෙපාර්තමේන්තු ක්‍රියාවලිය තුළ වඩා ශක්තිමත් කරලා, දිළිඳුභාවය මේ රටෙන් තුරන් කිරීමේ වැඩ පිළිවෙළ ශක්තිමත් කරමින් රට තුළ වඩා ජනතා සුබවාදී දිවිනැගුම වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම සඳහාත් තමයි දිවිනැගුම දෙපාර්තමේන්තු පනත පාර්ලිමේන්තුවට එන්නේ.

ගරු සභාපතිතුමනි, මේ පනත පාර්ලිමේන්තුවට එන අවස්ථාවේදී බරපතළ විධියට විවිධ කුමන්ත්‍රණ දියත් වුණා. විශේෂයෙන් විපක්ෂයේ ඇතැම් අය මේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා බරපතළ විධියට අභියෝගයට ලක් කළා. ඒ විතරක් නොවෙයි. විපක්ෂයේ ඇතැම් පක්ෂ, ඒ වාගේම විපක්ෂයේ විවිධ වෘත්තීය සමිති මේ පිළිබඳව අධිකරණයට පවා ගියා. මේ දිවිනැගුම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් වීම තුළ අධිකරණ ක්‍රියාදාමය තුළ යම් යම් බරපතළ සිදුවීම් මේ රටේ සිද්ධ වුණා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මේ පනත ක්‍රියාත්මක වීම සඳහා රජය පැත්තෙන් ඒ වේලාවේ විශාල පරිත්‍යාගයක් සිද්ධ කළා. මේ පනත අධිකරණයේ අවස්ථා දෙකක් - සාමාන්‍යයෙන් මේ රටේ අධිකරණය අර්ථ නිරූපණ අවස්ථා දෙකක් එක පනතකට දීලා තිබුණේ නැහැ. නමුත් මේ පනත සම්බන්ධව අර්ථ නිරූපණ දෙකක් දීලා තිබිය දීත්, 2/3 බහුතර සම්මතයක් පාර්ලිමේන්තුව තුළ සිදු කළ යුතුයි කියලා අධිකරණයට උපදෙස් ලබාදී තිබියදීත් රජය විසින් මේ පනත පසුගාමී තත්තවයට පත් කරන්නේ නැතිව ඒ වේලවේ ගත හැකි සියලු ක්‍රියාමාර්ග අරගෙන, ඒ වේලාවේ සියලු පළාත් සභාවලටත් යොමු කරලා මේ පනත ක්‍රියාත්මක කිරීමේ කටයුතු රජය සිද්ධ කළා. අපිත් බස්නාහිර පළාත් සභාව විධියට මේ පනතට උපරිම සහයෝගය ලබා දුන්නේ, එක් පැත්තකින් රජයේ වැඩ පිළිවෙළ ශක්තිමත් කරන්නත් විශේෂයෙන් මේ රටේ සමස්ත සමෘද්ධි නිලධාරීන්ගේ, සමෘද්ධි ව්‍යාපාරය, ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ ඕනෑකම වුණු ඒ දෙපාර්තමේන්තුව පිහිටුවීම තුළ නිලධාරීන්ට රාජ්‍ය සේවයේ පූර්ණ විශ්‍රාම වැටුප් හිමිකම වාගේම නිලධාරීන්ගේ අයිතිවාසිකම් තහවුරු කරන්නයි. දිවිනැගුම වැඩ පිළිවෙළ හරහා රටට ශක්තිමත් ආර්ථිකයක් ගොඩනැගීමට. නමුත් මම

මේ වේලාවේ මේ පනත සම්බන්ධව අදහස් ප්‍රකාශ කරන්නේ ඉතා කනගාටුවෙන්.

ගරු සභාපතිතුමනි, මේ වන විට මේ පනත විවිධ අභියෝගවලට ලක් වෙලා පාර්ලිමේන්තුව තුළ සම්මත වෙලා මාස අටකට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබෙනවා. ඒ වාගේම මේ පනත ක්‍රියාත්මක වෙන්න මේ මාස අට තුළ ආපු ගමන් මඟ පිළිබඳව අපි ඉතා හොඳින් විශේෂයෙන් මම සමස්ත ලංකාවේම වෘත්තීය සමිති නියෝජනය කරන නියෝජිතයා විධියට මේ සම්බන්ධයෙන් හොයලා බලලා කටයුතු කළා. නමුත් අපට යම් කනගාටුවක් තියෙනවා. මේ පනත මේ වන විට භාණ්ඩාගාරයේ සහ රාජ්‍ය අංශයේ ආයතන ක්‍රියාදාමය තුළ සිරවීමක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසාම අද සමෘද්ධි නිලධාරින්, සමෘද්ධි ව්‍යාපාරය මේ පනතෙන් අපේක්ෂා කරපු බලාපොරොත්තු ඉෂ්ට නොවීම පිළිබඳව දැඩි ලෙස කළකිරීමකට සහ (බාධා කිරීම්) කනගාටුවකට පත්වෙලා තියෙනවා ගරු සභාපතිතුමනි.

මේ වන විට මේ පනත සම්මත කිරීමෙන් පස්සේ විතරක් සමෘද්ධි නිලධාරින් විසි පහකට වැඩි ප්‍රමාණයක් මිය ගිහිල්ලා තියෙනවා. මේ පනත සම්මත වුණා නම් ඒ නිලධාරින්ගේ පවුල්වලට වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප, ඒ වාගේම රාජ්‍ය සේවයේ අනෙකුත් අයිතිවාසිකම් සහ පහසුකම් ලබා ගන්න හැකියාව තිබුණා. නමුත් අද පනත ක්‍රියාත්මක නොවීම තුළ නිතීයක් බවට ගැසට් නිවේදනයේ පළ කරලා ඊට පස්සේ නිලධාරින් පත් කරලා දෙපාර්තමේන්තුව පිහිටුවීම සිදු නොවීම තුළ මේ නිලධාරින් අසරණ භාවයට පත් වෙලා තියෙනවා. ඒ වාගේම ඇතැම් නිලධාරින් මේ වන විට විශ්‍රාම යන වයස පසු කරමින් සිටිනවා. ඒ නිසා ඔවුන් රැකියාවෙන් ඉවත්වන තත්ත්වයන්ට පත් වෙනවා. ගරු සභාපතිතුමනි, මේ වන විට සමහර නිලධාරින් විවිධ රෝගාබාධ නිසා රැකියාවෙන් ඉවත් වෙමින් තියෙනවා. මේ සියලු නිලධාරින්ට, නිලධාරින්ගේ පැත්තෙන් ගත්තාම මේ පනත ප්‍රමාද වීම තුළ අද ලොකු අසාධාරණයක් සිදු වෙමින් තියෙනවා. ඒ නිසා මම ඔබතුමා මගින් අතිගරු ජනාධිපතිතුමාට, ගරු ආර්ථික කටයුතු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාට මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා කඩිනමින් මේ දෙපාර්තමේන්තු ක්‍රියාවලිය ශක්තිමත්ව කරලා, ඒ හරහා ගැසට් නිවේදන පළ කරලා, සමෘද්ධි නිලධාරින්ටත්, ව්‍යාපාරයටත් වෙමින් තියෙන අසාධාරණය සහ - (බාධා කිරීමක්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බොරු කරලා තියෙන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කිසිම බොරුවක් වෙලා නැහැ ගරු මන්ත්‍රීතුමා. වෙලා තියෙන්නේ ප්‍රමාදයක් විතරයි. ඒ නිසා ඒ ප්‍රමාදය ඉක්මන් කර ගැනීම සඳහා තමයි අපේ ඉල්ලීම.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලේ පනත ගෙනෙනකොටත් මෙතුමන්ලාගේ විවිධ බොරු විවේචන තිබුණා. හැබැයි, ඒ විවේචනවලට නැවත පණ එන්න, නැවත ශක්තියක් වෙන්න රජය පැත්තෙන් උදව්වක්, එහෙම නැතිනම් නිලධාරින්ගේ පැත්තෙන් උදව්වක් වෙනවා මේ ප්‍රමාද වීම. ඒ නිසා නිලධාරින්ට අපි රජයේ භාණ්ඩාගාරයේ සහ මේ ක්‍රියාත්මක කරන නිලධාරින්ට ඒ වාගේම ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ඉහළ නිලධාරින්ට මතක් කරන්න ඕනැ. ඒ වාගේම ඔබතුමා මගින් ඇමැතිතුමා හරහා මේ පණිවුඩය අපි ලබා දෙනවා.

විශේෂයෙන් ඉක්මනින්ම මේ පනත ඉදිරි මාසය තුළ ක්‍රියාත්මක කරලා නිලධාරින්ගේ ඒ අවශ්‍යතා සම්පූර්ණ කරලා පනතින් ඉටු විය යුතු රාජ්‍ය සේවයේ අයිතිවාසිකම් තහවුරු කරන්නත්, රටේ ආර්ථිකය ශක්තිමත් කරන දිළිඳුභාවය පිටුදකින වැඩ පිළිවෙළ කඩිනමින් ක්‍රියාත්මක කරන්නටත් රජයට ශක්තිය ලැබෙන්නත් ඒ වාගේම ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නත් මේ හරහා ඉඩකඩ විවර වෙන්න කියලා ඉල්ලා සිටිමින් මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

බොහොම ස්තුතියි ගරු සභාපතිතුමනි, අද ලංකාවේ මෙතෙක් කල් මුස්ලිම් දේවස්ථාන විසි හතරකට ප්‍රහාර එල්ල වෙලා තියෙනවා. නමුත් කිසිම කෙනෙකු අද වනතුරුත් අත්අඩංගුවට අරගෙන නැහැ. ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ඒ කියන්නේ ගරු සභාපතිතුමනි, එදා ග්‍රෑන්ඩ්පාස් සිද්ධිය වූ දවසට මාසයකට පෙරත් ඒ දේවස්ථානයට ගල්වලින් ගහලා තිබුණා. ඒ කියන්නේ, නෝම්බි මාසය පටන් ගැනීමට පෙර. ඒ අවස්ථාවේදී බුද්ධශාසන අමාත්‍යාංශයෙන් ඒ ස්වාමීන් වහන්සේලා, පල්ලියේ කට්ටිය අපේ උදය ගම්මන්පිල ඇමතිතුමන්ලා කථා කරලා විසඳුමකට ආවා. ඒ විසඳුම තමයි, මාසයක කාලයක් ඒ මුස්ලිම් දේවස්ථානයේ මුස්ලිම් බැතිමතුන්ට යාඥා කිරීමට ලබා දෙන්න. ඒ අවස්ථාවේ තීන්දුවක් අරන් පිටවුණාට පස්සේ ඒ අවස්ථාවේදීම ඇවිල්ලා පල්ලියට ගල්වලින් ගහලා එතැන හිටපු මනුස්සයෙකුටත් ගහලා තිබුණා. (බාධා කිරීමක්)

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔන්න ගම්මන්පිල ඇමැතිතුමා -

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

නැහැ ඇමතිතුමා සැහෙන්න සේවාවක් කළා. අපි අගය කරනවා උදය ගම්මන්පිල ගරු ඇමතිතුමා. ඒ අවස්ථාවලදී එතුමා සැහෙන්න සේවාවක් කළා. නමුත් අපේ විරෝධතාවය මොකක්ද දන්නවාද? මේ දේවස්ථානවලට ගහන කට්ටිය ඇයි? අත්අඩංගුවට ගන්නේ නැත්තේ. නෝම්බි මාසයට පෙරත් ගහලා තියෙනවා. පොලිස්සියේ ඇන්ට්‍රිත් දාලා තියෙනවා. නමුත් කිසිම කෙනෙක් අද වනතුරුත් අත් අඩංගුවට අරන් නැහැ. ඊට පස්සේ -

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අහන්න කෝ රවුෆ් හකීම්ගෙන්.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

රවුෆ් හකීම් විතරද ඉන්නේ? මුස්ලිම් කට්ටිය අද වැඩිපුර එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙන්නේ? කෝ? මේ සම්බන්ධව එක්සත් ජාතික පක්ෂයේ නායකයා කිසිම කථාවක් කරලා නැහැ නේ? කෝ එක්සත් ජාතික පක්ෂයේ නායකයා? රවුෆ් හකීම් මහතා ගැන කථා කරන්න ඉස්සෙල්ලා තමන්ගේ නායකයා ගැන කථා කරන්න. නමුත් ගරු සභාපතිතුමනි, එදා නෝම්බි අවුරුද්ද ඉවර වුණ ගමන්ම ඒ දේවස්ථානය දහවෙනිදා භාර දෙන්න තිබ්බා. ඒ දේවස්ථානයේ ඒ කට්ටිය භාර දීමට සැලසුම් සහගතව ඉදිද්දී පටු දේශපාලනය සඳහා මැද කොළඹ සංවිධායක, නම කියන්නේ නැහැ මම -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නම කියන්න එපා.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

සංවිධායකකම ලබා ගැනීමට ඒ ජනතාවගේ ඡන්ද ලබා ගැනීම සඳහා නෝම්බියට පෙර -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මොන පක්ෂයේ ද ? පක්ෂය කියන්න කෝ?

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

මම නම කියන්නෙත් නැහැ. පක්ෂය කියන්නේත් නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

පක්ෂය කියන්න.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

පක්ෂය කියන්නේ නැහැ. නොම්බියට පෙර තීන්දුවක් අරගෙන තිබුණා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මැද කොළඹ සංවිධායක තමයි අපිත්.

[සභාවේ ඝෝෂා]

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ස්වාමීන් වහන්සේලා, පල්ලියේ කට්ටිය එකතු වෙලා සාකච්ඡා මේසයට එන්න ඕනෑ, නෝම්බියට පස්සේ මේ අයට යාඥා කිරීම සඳහා බලය ලබා දීම ගැන. නමුත් මේ දේශපාලනය කිරීම ගැන කනගාටුයි. අපි ඒ පල්ලියේ ඉන්න කට්ටිය අරගෙන බුද්ධශාසන අමාත්‍යාංශයට ගිහිල්ලා ලිඛිතව අරගෙන තිබුණා. නමුත් බුද්ධශාසන අමාත්‍යාංශයේ ලේකම්තුමාත් මේකට වැරැදිකාරයා. බුද්ධශාසන අමාත්‍යාංශයේ ලේකම් මොකක්ද දන්නවාද කරන්නේ? කවුරු හරි දේශපාලන පක්ෂයකින් ගිහිල්ලා කථා කළාම අනුමත කරනවා. ඊට පස්සේ ප්‍රශ්නයක් වුණාම ඉල්ලා අස්කර ගන්නවා. මොකක්ද මේකේ තේරුම?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔබතුමන්ලාගේම ආණ්ඩුව නේ?

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ඉතින් ගරු සභාපතිතුමනි, මගේ බැගෑපත් ඉල්ලීම නම් කිසිම දේවස්ථානයකට කිසිම කෙනෙකුට ගහන්න බැහැ. අද රටේ මේ අන්තවාදීන් විසින් කතෝලික දේවස්ථානවලට, හින්දු දේවස්ථානවලට, මුස්ලිම් දේවස්ථානවලට හිරිහැර සහ තාඩන පීඩන හැම එකක්ම කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇයි නවත්වන්න බැරි?

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

මේක වහාම නැවැත්වීමට කටයුතු සලසා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ඒ අවස්ථාවේදී, පොලීසිය ක්‍රියා කරපු විධිය, පොලීසිය පක්ෂපාතීත්වය අරගෙන තිබෙන්නේ. සුළු පිරිසක් විසින් පල්ලිය ඇතුළේ යාඥා කරද්දී ඇවිල්ලා ගහනකොට පොලීසිය නිහඬ වෙලා තිබෙන්නේ. එදා සීනියර් DIG අනුර සේනානායක මහතා කිව්වා, බුද්ධශාසන අමාත්‍යාංශයෙන් අපි බේරුවා. නැත්නම් ගිනි තියනවා කියලා. මේක කථාවක්ද? බේරුවා කියන්නේ, ගහනකල් නිකම් ඉන්නවා. ගිනි තියනකොට අල්ලනවා. ගිනි තියනකොට තමයි අල්ලලා තියෙන්නේ. ඉතින් මම

බැගෑපත්ව ඉල්ලීමක් කරනවා. අතිගරු ජනාධිපතිතුමාත් මේ ගැන දන්නවා. අතිගරු ජනාධිපතිතුමා ඒ අවස්ථාවේදී ෆවුසි ඇමැතිතුමාගේ ගෙදර පැයකට වැඩි කාලයක් ඉඳලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ඉතින් ගරු සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා. මම ඉල්ලා සිටිනවා, මේ දේවස්ථාවලට ගහපු කට්ටිය වහාම අත්අඩංගුවට අරගෙන නීතියෙන් දඬුවම් කරන ලෙසට.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා. මගේ හිතවත් අර්ෂාඩ් නිසාම්ඩීන් ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී කියැවුණා, මැද කොළඹ සංවිධායකතුමා තමයි මේක කළේ. වග කියන්න ඕනෑ කියලා. මම එක්සත් ජාතික පක්ෂයේ මැද කොළඹ සම සංවිධායක හැටියට ක්‍රියා කරනවා. ඒ නිසා එහෙම සංවිධායක කියනවා නම් එතුමා කියන්න ඕනෑ කවුද කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා සම සංවිධායක නේ?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

අපටත් බලපානවා. අපිත් සංවිධායකවරු. මම මැද කොළඹ නියෝජනය කරන සංවිධායකතුමා. අපි දැන ගන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා සම නේ?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

කවුද? මේක කළේ කියලා. මැද කොළඹ සංවිධායක -

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මැද කොළඹ ප්‍රධාන සංවිධායක.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

කවුද කියලා කියන්න ඕනෑ. නැත්නම් ඒක අයින් -

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

එක්සත් ජාතික පක්ෂයේ නොවෙයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මැද කොළඹ ප්‍රධාන සංවිධායක.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

කවුද එක්සත් ජාතික පක්ෂයේ -

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

නැහැ, නැහැ. නම කියන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා, ඔබතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීම සඳහා අවස්ථාව.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, සමාජයේ ඉතාම වැදගත් කාරණා කිහිපයක් සම්බන්ධව ප්‍රකාශ අද ගරු මන්ත්‍රීතුමන්ලා මේ සභාවේ කළා. ඒ අතරතුර මමත් ප්‍රකාශයක් කිරීමට ඔබතුමාගෙන් කල් ඉල්ලා සිටියේ, විශේෂයෙන්ම අපේ රටේ මතු වී තිබෙන කිරි ප්‍රශ්නය සම්බන්ධව ඔබතුමා මගින් මේ සභාවේ අවධානය යොමු කරන්නයි. විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, අද ඇතැම් කිරි පිටි වර්ග තහනමට ලක් කරලා තිබෙනවා. කනගාටුවට කරුණ ඒ සම්බන්ධව කිසිදු මාධ්‍යයකින් පැහැදිලි විග්‍රහයක් හරි ජනතාවට පැහැදිලි කිරීමක් සිදු වන්නේ නැහැ, අපි දන්නේ නැහැ මොකක්ද කාරණය කියලා. අද රට පුරා ජීවත් වන ජනතාව විශාල අසීරුතාවයකට පත් වෙලා තිබෙනවා. (බාධා කිරීමක්) වරද්ද ගන්න එපා මේ ප්‍රශ්නය. සරලව ගන්න එපා. මේ ප්‍රශ්නය පිළිබඳව ජනතාවට නිවැරදි අවබෝධය ලබා දීම මම හිතන්නේ මාධ්‍යවල විශාල වගකීමක් වෙනවා. මට ප්‍රශ්නය තිබෙන්නේ මාධ්‍යයට නිකුත් කිරීම නොවෙයි ගරු මන්ත්‍රීතුමා. දැන් සාමාන්‍යයෙන් මන්ත්‍රීවරයෙක් කාට හරි එරෙව්වා කිව්වා නම් මන්ත්‍රීවරයාගේ උප්පැන්නේ ඉඳලා මාධ්‍යවල වාර්තා කරනවා. මේ කිරි පිටි සම්බන්ධව විතරක් වෙනත් ක්‍රියා මාර්ගයක් - කිරි පිටි වර්ගය පිළිබඳව මාධ්‍ය වාර්තා කිරීම සම්බන්ධව මට යම්කිසි ප්‍රශ්නයක් මතු වුණා. ඒත් මේක පුදුමාකාර තත්ත්වයක්. කිරි පිටි වර්ග පිළිබඳව කිසිම මාධ්‍යයක් - මේක එක මාධ්‍යයක් කියලා

[ ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ]

නොවෙයි. රාජ්‍ය මාධ්‍ය, පෞද්ගලික මාධ්‍ය, මුද්‍රිත, විද්‍යුත් මාධ්‍ය කිසිම එකක් පැහැදිලිව මේ අහවල් කිරි වර්ග භාවිතය අත් හැරිය යුතුයි කියන කාරණය කියන්නේ නැහැ. ප්‍රෝටීන වර්ග පිළිබඳව වෙනම කතන්දර කියනවා. ඒ වුණත් මේ සම්බන්ධව ඇත්තෙන්ම අප ගත යුතු ක්‍රියා මාර්ග රාශියක් පිළිබඳව ඔබතුමා මඟින් විශේෂයෙන්ම ගරු සෞඛ්‍ය ඇමැතිතුමාට, ගරු සමුපකාර අමාත්‍යතුමාට, ඒ වාගේම අපගේ පශු සම්පත් කටයුතු පිළිබඳව ගරු අමාත්‍යතුමන්ලාට අවධානය යොමු කරනවා.

විශේෂයෙන්ම මේ ප්‍රශ්නය පිළිබඳව ඔබතුමන්ලාගේ මැදිහත් වීමක් අවශ්‍යයි. ඒකට හේතුව තමයි ගරු සභාපතිතුමනි, අපි කිරි පිටි වර්ග පානය කරන්න එපැයි කිව්වාම දරුවාට කිරි ලබා දෙන්න, දියර කිරි ක්ෂණිකව ලබා දෙන්න පුළුවන් සමාජ වටපිටාවක් විශේෂයෙන්ම බස්නාහිර පළාත තුළ නැහැ. ග්‍රාමීය පරිසරයන් තුළ කිරි එළදෙනෙක් අද හිටියත්, නාගරික පරිසරයේ දරුවෙකුට කිරි වීදුරුවක් ලබා දීම හරි අපහසු වෙනවා. දියර කිරි වර්ග. ඒ නිසා මම සමුපකාර අමාත්‍යතුමාගේත්, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගේත්, ඒ වාගේම පශු සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගේත් අවධානය යොමු කරනවා. ක්ෂණිකව මේ දියර කිරි ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් බස්නාහිර පළාත තුළ ඇති කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් අපි ආරම්භ කරන්න අවශ්‍යයි.

ඒත් එක්කම ගරු සභාපතිතුමනි, අපේ මාතෘ සායනවල පවුල් සෞඛ්‍ය සේවිකාවන් මඟින් විශේෂ වැඩ පිළිවෙළක්, ළදරුවන් සම්බන්ධව, ළදරුවන්ට අවශ්‍ය පෝෂණ තත්ත්වය පිළිබඳව - අපට කියන්න පුළුවන් අපි වැඩ සටහන් කරනවා කියලා. හැබැයි ඒ වැඩ සටහන් කරනවා කියලා අපට මඟ අරින්න පුළුවන්කමක් නැහැ. මේ ඇති වී තිබෙන තත්ත්වය තුළ මව්වරු දැනුවත් කරමින් දරුවන්ගේ පෝෂණ තත්ත්වය පිළිබඳ විශේෂ වැඩ පිළිවෙළක් සම්බන්ධව අපේ අවධානය යොමු කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා. එහෙම නොවුණොත් මේ ප්‍රශ්නය නිසා තව අවුරුදු හතරක් පහක් යනකොට අපට වෙනත් ප්‍රශ්නයක් මතු වෙනවා. අපේ දරුවන්ගේ මන්ද පෝෂණ තත්ත්වය පිළිබඳව. ඒ නිසා මම ඔබතුමා මඟින් අවධානය යොමු කරනවා, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට. ගරු සමුපාකාර අමාත්‍යතුමාට. ගරු පශු සම්පත් කටයුතු අමාත්‍යතුමාට. ඔබතුමන්ලා ඒකාබද්ධව විශේෂයෙන්ම මුදල් ප්‍රතිපාදන අවශ්‍ය නම් මේ සභාවේ අනුමැතිය හෝ ලබාගෙන දියර කිරි ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් ජනතාවට සකස් කිරීම සඳහා මැදිහත් විය යුතුයි කියලා මම අවධානය යොමු කරනවා. ඒ නිසා ඔබතුමා මඟින් සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරලා පිටිකිරි වර්ගවල මතු වී තිබෙන ප්‍රශ්නය පිළිබඳව ජනතාවට නිවැරදි තත්ත්වය දැනුවත් කිරීමත්, කිරි පිටි වර්ග - දැන් අපි දන්නවා සමහරක් සුරූපී නිළියන්, සමහරක් රූප රාජිණියන්, සමහරක් ක්‍රීඩකයින් මේ කිරි පිටි වෙනුවෙන් පෙනී හිටියා. අද කවුරුවත් නැහැ. ඉතින් අපට කියන්න බැහැ මේ මොන කිරි පිටි වර්ගයද කියලා. සමහර ගේන කිරි වර්ග විද්‍යාත්මක නාමවලින් කියනවා. සමහර වර්ග වෙළඳ පොළේදී හඳුනා ගැනීමට පුළුවන්කමක් නැහැ. සමහර තැන්වල වෙළඳසැල් හිමියෝ මේවා හංගාගෙන විකුණනවා. සමහර වෙලාවට මේවා කළු කඩේටත් යන්න පුළුවන් තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. මේ නිසා වෙළඳ නාමයෙන් හඳුන්වන කිරි වර්ග, මම මාධ්‍යවලින් ඉල්ලීමක් කරනවා. මේ විද්‍යාත්මක නාමය නොවෙයි. අපේ ගම්බද ඉන්න අහිංසක මිනිස්සුන්ට මේ වෙළඳ නාමයෙන් හඳුන්වන මොන කිරි වර්ගයද කියන කාරණය ජනතාවට දැනුවත් කිරීම සඳහා සහයෝගය දෙන්නට ඕනෑ. නැත්නම් මේ ප්‍රශ්නයේදී අපේ දරුවන්, අපේ මව්වරු විශාල අසීරුතාවයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. අපට වෙන්නේ මොනවාද කියන කාරණය නොවෙයි, මේ දරුවන්ට දියර කිරි ලබා දීම සඳහා - හැම මවකටම දිගටම මව්කිරි ලබා දීමට පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ දරුවන්ට අඩු ගණනේ දියර කිරි ලබා දීම සඳහා අපි මැදිහත්වීමක් කළ යුතුයි. ඒ සඳහා කැබිනට් මණ්ඩලය සහ ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ඇතිව මේ සභාවේ විශේෂ මුදලක් වෙන් කරලා හරි දියර කිරි වෙනත් පළාත්වලින් ගෙන්වලා මේ ප්‍රදේශයේ දරුවන්ට ලබා දීම සඳහා අවධානය යොමු කරන්න කියන කාරණය පිළිබඳව ඔබතුමා මඟින් අවධානය යොමු කරමින්, කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, මම ප්‍රථමයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ සම්බන්ධව මට ප්‍රකාශයක් කිරීමට අවස්ථාව සලසා දීම පිළිබඳව. මම සිංහල කාන්තාවක්. මම බෞද්ධ කාන්තාවක්. නමුත් මම කවදාවත් මගේ බෞද්ධකමෙන් වෙනත් ආගම්වලට අසාධාරණයක් වෙන්න ඉඩ තියලා නැහැ. ඒ වාගේම මගේ සිංහලකම වෙනත් ජාතීන්ට ගැටළු ඇති වෙන්න මම ඉඩ තියලා නැහැ. මගේ ප්‍රදේශයේ සියලුම ජාතීන් එකට ජීවත් කරන්නට, සියලු දෙනාගේම අයිතිවාසිකම්වලට ගරු කරන්නට පුරුදු කරපු පරිසරයක් මම මගේ ගම තුළ ඇති කරලා තිබෙනවා. අපි ජාතිවාදයේ තිබෙන වේදනාව හොඳින් දන්නා පිරිසක්. අවුරුදු 30 ක පමණ කුරිරු යුද්ධයකට මුහුණ දුන්නු අපව අපේ දරුවෙකුට පාරේ බැහැලා භය නැතුව යන්න පුළුවන්කම තිබුණේ නැහැ. අම්මා තාත්තාට දරුවන්ට එකට මේ රටේ ගමන් කරන්න අවස්ථාවක් තිබුණේ නැහැ. ඒ වාගේම සිංහල හෝ වේවා, ද්‍රවිඩ හෝ වේවා, මුස්ලිම් හෝ වේවා පිරිස වෙන් කරලා ත්‍රස්තවාදීන් පහර ගැසුවේ නැහැ. එකම බෝම්බයට සිංහල ජනතාව, මුස්ලිම් ජනතාව, දෙමළ ජනතාව බිලි වුණු අතීතයක් අපට තිබෙනවා. ඒක නිසා මේ අතීතයෙන් අපි පාඩම් ඉගෙන ගත යුතුයි කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. අපට ජාත්‍යන්තරයෙන් ඕනෑ හැටියේ උදාහරණ තිබෙනවා, මේ කනගාටුදායක තත්ත්වය ගැන. අපි ලෝකයේ රටවල්වල දිහා බැලුවොත් රූපවාහිනිය බලනකොට පකිස්ථානයේ අහවල් තැන බෝම්බයක් පිපිරුවා,

මෙපමණ ගාණක් මිය ගියා. ඇෆ්ගනිස්ථානයේ මේ වාගේ දෙයක් සිද්ධ වුණා. ඉරාකයේ, ඉරානයේ මේ වාගේ දේවල් සිද්ධ වෙනවා කියලා මුස්ලිම් රටවල් අපට උදාහරණයට පෙන්වන්න පුළුවන්. මේ ඔක්කෝම සිද්ධ වෙන්නේ යම් බල අරගල, බලය ලබා ගැනීමේ අරගල තුළ. නමුත් ශ්‍රී ලංකාවේ මේ ජාතිවාදය, ත්‍රස්තවාදය අතුගාලා දාලා, අවුරුදු 30 ක් තිබුණු ඒ කාලකණ්ණි අතීතයට තිත තියලා අපි ලොකු ජයග්‍රහණ ලබා ගත්තු ජාතියක්. ලොකු ජයග්‍රහණ ලබා ගත්තු රටක්. ශ්‍රී ලාංකිකයන් හැටියට මේ රටේ සියලු දෙනාටම එකට ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් මේ රට තුළ නිර්මාණය වෙලා තිබෙනවා. නමුත් සමහර කොටස් බලය පිළිබඳ කෑදරකමින්, නායකත්වයන් පිළිබඳ කෑදරකමින් යම් යම් අංචි ඇදීමට උත්සාහ කරන බව පසුගිය කාලයේ අපේ සමාජ වටපිටාව බැලුවාම පෙනෙන්නට තිබෙනවා. මම සිංහල කාන්තාවක් හැටියට, බෞද්ධ කාන්තාවක් හැටියට මේ තත්ත්වය පිළිබඳව හුඟක් කනගාටු වෙනවා. අපි මේ වලි කන්නේ අපේ දරුවන්ට නැවතත් යුද්ධය උරුම කරන්නද? නැවතත් අපේ අනාගත පරම්පරාව විනාශ කරන්නද කියන එක මම සියලු දෙනාගෙන්ම අහනවා. මම හිතන්නේ, ඒක අපි සියලු දෙනාම හිතන්නට ඕනෑ දෙයක්. එක එක නම් කියමින් කුටු කුටු ගෑවට ඒ අයට පිංසිද්ධ වෙන්න තමයි මේ රට ස්වාධීන රටක් හැටියට පත් වුණේ. ඔය හුඟක් නායකයින්ට ඒ තත්ත්වය ඇති කරන්න බැරි වුණු බව හෘදය සාක්ෂියට එකඟව තමුන්නාන්සේලා කල්පනා කරලා බලන්න කියලා මම ඉතාම ගෞරවයෙන් ආරාධනා කරනවා.

ගරු සභාපතිතුමනි, මේ සභාව තුළත් සියලු මුස්ලිම් මන්ත්‍රීවරු, සියලු ද්‍රවිඩ මන්ත්‍රීවරු, සියලු සිංහල මන්ත්‍රීවරු සමග මම සුහදත්වයෙන් වැඩ කරන කෙනෙක්. ඒ අයගේ ඕනෑ එපාකම් මොනවාද කියන එක හිතට අවංකව පිළිගන්නා කෙනෙක්. තමන්ගේ අයිතිය වෙනුවෙන් තමන් සටන් කරනකොට අපි ඔහු පාගා දමන්න උත්සාහ කරන්නේ නැහැ. නමුත් මම ඉල්ලා සිටින්නේ, මේ කාලකණ්ණි ත්‍රස්තවාදය නැවැත ඇති කරන්න උත්සාහ කරන්න එපා. අපි සියලු දෙනාම මේ රට අපේ දරුවන් වෙනුවෙන් සමාකාමී රටක් බවට පත් කරන්න මහන්සි ගන්න කියලා. මෙගොඩ කොලොන්නාව කියන්නේ 513 ග්‍රාම නිලධාරී වසම. ඡන්දදායකයින් දහදහස් ගණනක් සිටින කොට්ඨාශයක්. එයින් දෙදාහක් සිංහල ජනතාවත්, අටදාහකට වැඩි පිරිසක් මුස්ලිම් ජනතාවත් ජීවත් වෙනවා. මම කිසි කෙනෙකුට මගේ ඉඩම් විකුණලා නැහැ. මම කිසි කෙනෙකුට ගෙවල් හදලා දීලා නැහැ. නමුත් මගේ ප්‍රදේශයට ආපු ජනතාවගේ ඕනෑ එපාකම් ඉෂ්ට කරන්න, අවශ්‍යතා සොයා බලන්න මහජන නියෝජිතවරියක් හැටියට මම බැඳී සිටිනවා. එතැනදී මට ජාතීන් පිළිබඳ ප්‍රශ්නයක්, එහෙම නැත්නම් ආගම් පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. ඒ අයගේ ආගම අදහන්න, ඒ වාගේම බෞද්ධයන්ගේ අනන්‍යතාවය රැකගෙන ජීවත් වෙන්න මම කටයුතු කරලා තිබෙනවා. පසුගිය කාලේ කිහිප වතාවක් ජාතිවාදී ගිනි දළු ඇවිල්ලෙන්න ගත්තත් සිංහල ජනතාවත්, මුස්ලිම් ජනතාවත්, ද්‍රවිඩ ජනතාවත් මා කෙරෙහි විශ්වාසය උඩ කිසිම ජාතිවාදී ගිනි දැල්ලක් ඇවිලෙන්නට ඉඩ නොදී ඒ භයානක හැම අවස්ථාවකම මගේ කොට්ඨාශය මම ආරක්ෂා කළා. මගේ ආසනය මම ආරක්ෂා කළැයි කියන සාක්ෂි තමුන්නාන්සේලාට ඕනෑ හැටියේ තිබෙනවා. නමුත් පසුගිය දිනක ගිනි අවුලන්න ආපු පිරිසක් මම එතැනට ගිය නිසා අවුලන්න බැරි වීම නිසා ඒ අය ඉතාම නරක විදියට කොළොන්නාව හන්දියේදී මාව විවේචනයට ලක් කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමියගේ ප්‍රකාශය කෙටි කරන්න.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

මට ඡන්දය දෙන්න එපා කියලා කිව්වා. නමුත් මම විශ්වාස කරනවා ජනතාවට ඒ ගැන හොඳ වැටහීමක් තිබෙනවා. මම කවදාවත් හොරකම් කරලා නැහැ. මම කවදාවත් පගා ගහලා නැහැ. මම කවදාවත් වැරැදි වැඩ කරලා නැහැ. බෞද්ධ සිංහල කාන්තාවක් හැටියට මම ඉතා පිරිසිදු ජීවිතයක් ගත කරන කෙනෙක්. නමුත් අද කුමන්ත්‍රණ තිබෙනවා ඒ වාගේ අයව විනාශ කරන්නට. මට මා ගැන ඒ තත්ත්වය ගැන බලාගන්නට මට ශක්තිය තිබෙනවා. නමුත් මම සියලු දෙනාගෙන්ම ඉතා ආදරයෙන් ඉල්ලා සිටින්නේ අතිගරු ජනාධිපතිතුමා ඇති කරපු මේ සාමය, මේ නිදහස අපේ දරුවන්ට මේ රටේ දෙවුන්දර තුඩුවේ ඉඳලා, පේදුරු තුඩුව දක්වා ඇවිදින්නට ලබා දුන්නු නිදහස විනාශ කරන්නට එපා. අනෙක් රටවල බෝම්බ පුපුරණකොට, අපි හිතන්නේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔය කථාව ගෝඨාභයට කිව්වා නම් හරි.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

කරුණාකරලා ශිලාචාර වෙන්න. මේ වාගේ කථාවක් කරනකොට ඇහුම්කන් දෙන්න ශීලාචාර වෙන්න කියලා විරුද්ධ පක්ෂයෙන් මම ඉල්ලා සිටිනවා,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, බාධා කිරීම් කරන්න එපා.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

මේ කිසි කෙනෙක් එහෙම නොකරද්දී. මම අවසාන වශයෙන් ඉල්ලන්නේ මේ ජාතිවාදී ගිනි දළු ඇවිලෙන්න ඉඩ දෙන්න එපා. අපේ දරුවන්ට දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා ඇවිදින්න, සතුටින් ජීවත් වෙන්න, දෙමව්පියන් සමග ගමන් යන්න, සියලු ජාතීන් එක්ක එකතු වෙලා කටයුතු කරන්න, උත්සව

[ ගරු අශෝකා ලංකාතිලක ]

පවත්වන්න පුළුවන් වාතාවරණය මේ රටෙන් තුරන් කරන්න කිසිම කෙනෙක්. ආයේ අවස්ථාව දෙන්න එපා කියන දයාබර ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. ඒ සියලු දෙනාගෙන් මම ඉල්ලා සිටින්නේ, මේ අපේ රට ශ්‍රී ලංකාව. ශ්‍රී ලංකාව නිදහස් රටක් වශයෙන් ගෙන යන්න සියලු දෙනා එකමුතුව වැඩ කරමු කියලා ඉල්ලන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී පෙරවරු තේ විවේකය සඳහා මෙම සභාව විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.45 ට යළිත් රැස්විය.***
*Sitting, accordingly suspended until 11.45 a.m. and then resumed.*

## පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, *"2013.08.06 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළඹුණු එකඟතාවයට අනුව අද දින 2013.08.19 දින විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව 2013.09.03 දින පෙ.ව. 9.30 ට රැස්විය යුතු අතර 2013.08.20 වන අඟහරුවාදා දිනය සභා රැස්වීම් නොපැවැත්වෙන දිනයක් ලෙස සලකා ක්‍රියා කළ යුතුය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් සභාවේ කටයුතු සම්බන්ධ යෝජනාව -

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු සභාපතිතුමනි, සභාවේ ගණ පූරණය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

දැනට විනාඩි 05 ක කාලයක් ඉක්ම ගොස් තිබෙනවා. අද උදෑසනත් ගණ පූරණය පිළිබඳව ප්‍රශ්නය විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් විසින් නඟනු ලැබුවා. මේ අවස්ථාවේදී සභා ගර්භයේ ගරු මන්ත්‍රීවරුන් 14 දෙනෙකු පමණක් සිටිනවා. මම පැයක කාලයක් මාගේ නිල කාමරයේ රැඳී සිටියේ ගරු මන්ත්‍රීවරුන් සභා ගර්භයට එකතු වේය කියන බලාපොරොත්තුවෙන්. නමුත් මට මේ අවස්ථාවේදී පෙනී යනවා සීනුව නාද කර විනාඩි 05 ක කාලයක් තුළත් ගරු මන්ත්‍රීවරුන් 14 දෙනෙකු පමණක් සිටින බැවින් තවදුරටත් මෙම සභාව පවත්වාගෙන යාමේ අපහසුතාවයක් තිබෙන බව. මේ අවස්ථාවේදී මෙම සභාවේ ගණ පූරණය සම්පූර්ණ වී නොමැති නිසා

## 12(1) රීතිය යටතේ කල් තැබීම
ADJOURNMENT UNDER RULE NO. 12(1)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

12 (1) රීතියට යටතේ *"මම දැන් මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව පූ.භා. 11.55 ට, 2013 සැප්තැම්බර් මස 03 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Aaccordingly, the Provincial Council was adjourned at 11.55 a.m. till 09.30 a.m., on 03.09.2013*